# කායික සංචලන බුද්ධිය

කායික සංචලන (Body smart) බුද්ධිය යනු අදහස් සහ හැඟීම් ප්‍රකාශ කිරීමට කෙනෙකුගේ මුළු ශරිරයම භාවිත කිරීමේ විශේෂඥතාවයයි.

එය කෙනෙකුගේ ශරීර චලනයන් පාලනය කිරීමට සහ දක්ෂ ලෙස වස්තූන් හැසිරවීමට ඇති හැකියාවයි.

ඉහළ කායික සංචලන බුද්ධියක් ඇති පුද්ගලයින්ට ඕනෑම ක්‍රියාවක දී සම්පූර්ණයෙන්ම තම ශරිර පාලනය කිරීමට ඇති හැකියාව හා මෙවලම් මනාව හැසිරවීමේ හැකියාව ඇත.

**කායික සංචලන බුද්ධිය සහිත පුද්ගයන් හොඳින් ඉගෙන ගන්නේ**

- රඟපෑමෙන්
- නැටුම්වලින්
- අත්හදා බැලීමෙන්
- ක්ෂේත්‍ර චාරිකාවලින්
- ජිම්නාස්ටික්වලින්
- නව නිපැයුම්වලින්
- සටන් කලාවෙන්
- අංග චනයෙන් රඟපෑමෙන්
- රූකඩ කලාවෙන්
- සංචාරය කිරීමෙන්
- ව්‍යායාම කිරීමෙන් ආදී...

**රැකියා/ වෘත්ති**

- නළු නිළි
- මලල ක්‍රීඩක
- වඩු කාර්මික
- නර්තන ශිල්පි
- අත්යන්ත්‍ර ශිල්පි
- ආරක්ෂක නිලධාරී
- ශෛල්‍ය වෛද්‍ය
- යාන්ත්‍රික ශිල්පි
- ශාරීරික අධ්‍යාපන ගුරු
- භෞත චිකිත්සක
- වන සංරක්ෂන නිලධාරි
- ඉදිකිරීම් කරන්නා
- ගොවියා
- ගිනි නිවන භටයා ආදී...

Guidance and Counselling Unit, National Institute of Education, Maharagama